# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2274/38 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2022.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ඕපනායක ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/RN/502.
2022 මාර්තු මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 244, උතුරු හුණුවල වසමේ අංක 5 කොටස, නව ගම්මානය ගමේ පිහිටි හුණුවල වත්ත අංක 5 කොටස නමැති ඉඩමෙන් අක්කර 01 පර්චස් 80 ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අත්හරින ලද පැරණි රබර් වගාව ; |
| *නැගෙනහිරට* | : | අත්හරින ලද පැරණි රබර් වගාව ; |
| *දකුණට* | : | අත්හරින ලද පැරණි රබර් වගාව ; |
| *බටහිරට* | : | අත්හරින ලද පැරණි රබර් වගාව. |

1A - G 36570 — 32 (2022/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : කහවත්ත වැව්ලි සමාගම

EOG 04 - 0057

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කලවාන ජල සම්පාදන ක්‍රමය යටතේ තුළුමං ළිඳ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/04/RN/503.
2022 මාර්තු මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 197/බී, කොස්වත්ත ග්‍රාම නිලධාරි වසමේ වරතැල්ගොඩ ගමේ පිහිටි කොස්වත්ත ගඟ රක්ෂිතය නැමැති ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

*උතුරට* : කැබලි අංක 119 යේ කොටසක් ;
*නැගෙනහිරට* : කැබලි අංක 120 කොටසක් ;
*දකුණට* : කොස්වත්ත ගඟ ;
*බටහිරට* : කැබලි අංක 120 කොටසක්.

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : සොයාගත නොහැක

EOG 04 - 0058

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.